# ලෝකාලෝකය

## 2024 දෙසැම්බර්
## 2025 පෙබරවාරි කලාපය

**මක්නිසාද**
**අපට ළදරුවෙක් උපන්නේය,**
**අපට පුත්‍රයෙක් දෙනලද්දේය,**
**ආණ්ඩුවද උන්වහන්සේගේ කර පිට තිබෙන්නේය.**
**උන්වහන්සේ අපූර්වය, මන්ත්‍රීවරයාය,**
**පරාක්‍රමවත් දෙවියන්වහන්සේය,**
**සදාකාල පියාණෝය, සමාදානයේ කුමාරයායයි**
**කියනු ලබන්නේය.**
**(යෙසායා 9 : 6)**


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901




# නත්තල් තෑග්ග

සුහම සුභ නත්තලක් වේවා කියලා පුංචි ඔයාලා හැමෝටම සුභ පතන අතර ඔන්න අදත් මම ලස්සනම ලස්සන කථාවක් ඔයාලට අරගෙන ආවා.

මම දන්නවා පුංචි ඔයාලා නම් මේ ලඟි ලඟියේ සූදානම් වෙන්නේ නත්තල් උත්සවය සමරන්න කියල, මොකද මේ කාලයේදී තමයි ඔයාලාට ලස්සන ඇඳුම්, තෑගි භෝග එහෙම ලැබෙන්නේ. හොඳයි දරුවනේ එහෙම නම් අපි මේ කථාව කියවලා ඉමුකෝ.

ඔන්න එක නගරයක ජීවත් වුණා අම්මයි, තාත්තයි, රෝසි කියලා පුංචි ගැහැණු ළමයෙකුයි. මේ පුංචි පවුල බොහෝම ආදරයෙන්, සතුටින් ජීවත් වුණා. මොකද එයාලා දෙවියන්වහන්සේව අදහන භක්තිවන්ත පවුලක්. ඉතිං එයාලා ගෙදරදී යාච්ඤා කළා, ඉරිදා පල්ලියට ගියා සහ හැමෝටම ආදරයෙන් කරුණාවෙන් සැලකුවා. ඔවුන් පල්ලියට යන මාර්ගයේ අයිනක පුංචි ගෙදරක් තිබුණා. ඒ ගෙදර ජීවත් වුනේ අම්මයි, දුවලා දෙන්නෙකුයි. ඔවුන්ට ජීවත් වෙන්නට නිතරම වැඩ කරන්න සිදුවුණා. ඒ ඔවුන් හරිම දුප්පත් නිසා. මේ නිවස ළඟින් යන එන විට මේ පවුල දකින රෝසිට හරියට දුක හිතුණා. එයා ඒ පවුල ගැන යාච්ඤා කරන්නත් පටන් ගත්තා. ඒත් කවදාවත් රෝසිට එයාලා සමඟ කථා කරන්න අවස්ථාවක් ලැබිලා නෑ. මොකද එයාලා හැම වේලාවකම වැඩ කළා. රෝසිට උවමනා වුණා දෙවියන්වහන්සේ ගැන එයාලට කියලා දෙන්න. එයාලවත් එක්කගෙන පල්ලියට යන්න. එයා දෙවියන්වහන්සේ තුළ ලබන ප්‍රීතිය එයාලටත් ලබා දෙන්න. ඒකට අවස්ථාවක් ලබා දෙන්න කියලා එයා දෙවියන්වහන්සේට යාච්ඤා කළා.

ඔන්න දැන් ඒකට අවස්ථාව ඇවිල්ලා මේ දෙසැම්බර් මාසය එහෙමත් නැත්නම් නත්තල් සමරන මාසය පුංචි රෝසිට මතක් වුණා. හැම නත්තල් දවසටම එයාලගේ ගෙදර පොඩි උත්සවයක් පවත්වනවා. එදාට එයාට ලස්සන නත්තල් තෑග්ගකුත් ලැබෙනවා. එයා ඉවසීමෙන් බලාගෙන හිටියා. දවසක් රෝසිගේ අම්මයි තාත්තයි එයාට කතා කරලා ඇහුවා ඔයාට මෙදා සැරේ නත්තලට ඕන තෑග්ග මොකක්ද කියලා. රෝසි හෙමින් කිව්වා මට මේ සැරේ තෑග්ගක් එපා ඒ වෙනුවට මට ඔයාලගෙන් ඉල්ලීමක් කරන්න ඉඩ දෙන්න කියලා. එයා ඇහුවා අම්මේ මම මේ සැරේ අපේ ගෙදර නත්තල් සාදයට අර පාර අයිනේ ගෙදර ඉන්න පවුලට ආරාධනා කරන්නද කියලා. ඉතින් අම්මයි තාත්තයි දෙන්නම කිවුවා පුතේ සාදයට අපේ නෑදෑයෝ හැමෝම එනවනේ අපි කොහොමද එයාලට එන්න කියන්නේ. ඒත් පුංචි රෝසිගේ පෙරැත්ත කිරීම නිසාම දෙමවුපියන් ඒ ඉල්ලීමට අවසානයේ කැමති වුණා. රෝසිට හරිම සතුටුයි. එයාට ඕන වෙලා තිබුණේ කොහොම හරි යේසුස්වහන්සේ එයාලට ගොඩක් ආදරේ බව කියලා දෙන්න. ඉතිං දරුවනේ රෝසිගේ හිතේ තිබුණ ආශාව ලෙසම ඒ පවුලේ අයට යේසුස්වහන්සේගේ ආදරය ගැන ඇය කියලා දුන්නා. අවසානයේ ඒ හැමෝම එකට එකතු වෙලා යේසුස්වහන්සේ තුළ සතුටින් ප්‍රීතියෙන් කාලය ගත කළා.

දුවේ පුතේ ඔයාලට මොකද හිතෙන්නේ මේ කථාව කියෙව්වම ඔව් අපිටත් පුළුවන් නේද රෝසි වගේ තවත් අයට යේසුස්වහන්සේ ගැන කියලා දෙන්න.

අපට දිනපතා මුණගැහෙන අපේ යහළුවන්ට, නෑදෑයන්ට අපේ අසල්වැසියන්ට යේසුස්වහන්සේගේ ආදරය ගැන කියලා දෙන්න. පුළුවන් නේද? පුංචි ඔයාලා දන්නවා යේසුස්වහන්සේ කුරුසියක ජීවිතය පූජා කළේ අපි හැමෝගේම පාපය උදෙසායි. උන්වහන්සේ අපි හැමදෙනාටම සදාකාල ප්‍රේමයකින් ප්‍රේම කරන බව ශුද්ධවූ බයිබලයේ සඳහන් වෙනවා. ඒ වගේම ශුද්ධ වූ බයිබලයේ **2 තිමෝති 4:5** හි මෙහෙම සඳහන් වෙනවා. **"ශුභාරංචිය ප්‍රකාශ කරන්නකුගේ වැඩේ කරපන්න"**.

ඉතිං දුවේ පුතේ මේ අසිරිමත් නත්තලේ ඔයාලා හැමෝටම යේසුස්වහන්සේගේ සුභ පණිවිඩය අන් අය අතරේ බෙදා දෙන්නට හැකි වේවා. ඔයාලා හැමෝටම සුභම සුභ නත්තලක් වේවා. දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබේවා!

**- තබීතා නැන්දා -**

# නත්තලෙන් ප්‍රදර්ශනය වන දෙවියන්වහන්සේගේ අසිරිමත් ආදරය

### "මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළ සේක" - යොහාන් 3:16 -

2024 වසර ගෙවී යන්න ආසන්නව ඇත. තවත් දෙසැම්බර් මාසයකට පා තබා ඇති අප "නත්තල්" යන වචනය සිත්තුළ පිළිරුව් දෙමින් තිබේ. ජීවිතයට, සතුට, දුක, වේදනාව, කලකිරීම්, එපා වීම් වැනි ධන, ඍණ හැඟීම් හා අත්දැකීම් ලබා දුන් 2024 ද ගෙවී යමින් ඇත. සියල්ල දරා ගනිමින් අපද ජීවිතයේ තවත් වසරක් පසුකරමින් ඉදිරියට පැමිණ තිබෙන මොහොතක, මතකයෙන්ම අප බොහෝදෙනා දන්නාවූ බයිබල් පදයක් වෙත ඔබගේ අවධානය යොමු කරවීමට උත්සාහ කරමි.

දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කොතරම් ප්‍රේම කළාද යත් තම ඒකජාතක පුත්‍රයාණන් මනුෂ්‍ය ලෝකයට එවූ සේක. මෙහි සඳහන් "දෙවියන්වහන්සේ" පිළිබඳව ඔබ කවදා හෝ වාඩිවී නිස්කලංකව සිට සිතා බලා තිබේද? පරීක්ෂණාගාරයක පරීක්ෂණ නලයක් තුළ විද්‍යාත්මක පරීක්ෂණයකින් දෙවියන්වහන්සේව ඔප්පුකර පෙන්විය නොහැක. පරිගණක තිරයක් හෝ දුරකථනය මත දෙවියන්වහන්සේව පෙන්විය නොහැක. උන්වහන්සේව අතගා ස්පර්ශ කිරීමටද නොහැක. අපගේ පංචේන්ද්‍රියන්ට දෙවියන්වහන්සේ හසු නොවේ. එහෙත් දෙවියන්වහන්සේ නැත යන සංකල්පය සත්‍ය නොවේ යැයි මින් අදහස් නොවේ. උන්වහන්සේ මේ විශ්වයේ මැවුම්කරු බව බයිබලය පවසයි. (**උත්පත්ති 1:1**) ඉන් අදහස් වන්නේ උන්වහන්සේ සියල්ල සෑදූ බවය. මේ විශ්වය අති විශාලය. එමෙන්ම පරක් තෙරක් නොමැත. මනුෂ්‍ය මොළයට හා මනසට අවබෝධකර ගැනීමේ හැකියාවට ඔබ්බෙන් පවතී. ඉතාම සංකීර්ණය (බයිබල පවසන්නේ දෙවියන්වහන්සේ මේ විශ්වය මැවූ බවයි).

එමෙන්ම දෙවියන්වහන්සේ කථා කරන බවද බයිබලය පවසයි. දෙවියන්වහන්සේ මෙසේ පවසයි. "මම ඔබට ආදරෙයි, මම ඔබට ආදරෙයි, මම ඔබට ආදරෙයි, ඔබ කවුරුන් වුවත්, ඔබේ තත්වය කුමක් වුවත් මම ඔබට ආදරෙයි". මේ මොහොතේම දෙවියන්වහන්සේගේ

ප්‍රේමය පිළිබඳව ඔබගේ හදවතේ බලාපොරොත්තුවක් ඇත. මක්නිසාද අප සියල්ලෝම ප්‍රේමය සොයන්නන්ය. එබැවින් අප යම් කෙනෙකුගේ ප්‍රේමය බලාපොරොත්තුවෙන් සිටියි".

ස්වභාවධර්මය අපට දෙවියන්වහන්සේව හෙළිදරව් කරයි. එමෙන්ම ඔබ ගැන සිතා බලන්න. ඔබගේ හෘදසාක්ෂිය දෙවියන්වහන්සේව ඔබට පෙන්වයි. ඒ කෙසේදයත් ඔබ කුඩා හෝ වැරැද්දක් කරන විට "කුඩා හඬක්" ඔබගේ ඇතුලතින් ඇසෙයි. එමෙන්ම බයිබලය තුළින් දෙවියන්වහන්සේව අප හෙළිදරව් කරයි. එමෙන්ම යේසුස්ක්‍රිස්තුස්වහන්සේ දෙස බලන කල අප දකින්නේ මනුෂ්‍යයා හා දෙවියන්වහන්සේ යන දෙදෙනාමය. යේසුස්වහන්සේ අපට දෙවියන්වහන්සේව සම්පූර්ණයෙන්ම එළිදරව් කරන සේක. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ ස්වරූපය යැයි බයිබලය පවසයි. අවසාන දවස්වලදී දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කතා කළේ උන්වහන්සේගේ පුත්‍රයා මගිනි. යේසුස්වහන්සේ සියලු දේට උරුමක්කාරයා ලෙස පත් කර ඇති අතර, උන්වහන්සේ කරණකොටගෙන ලෝකය සෑදු සේක **(හෙබ්‍රෙව් 1:1-2)**.

සත්‍ය වශයෙන්ම දෙවියන්වහන්සේ ඔබ සහ මා මැව්වා නම්. අප කැඩී ගිය විට නැවත නිවැරදි ලෙස හරිගැස්වීමට උන්වහන්සේට හැකිය. අප කැඩී ගොස් ඇත. අපව නැවත සකස් කිරීමට අවශ්‍යය. අප උන්වහන්සේට පැවසුවොත්, ක්‍රිස්තුස්වහන්සේට අපව නැවත නිවැරදි ලෙස සකස් කිරීමට හැකිය. දෙවියන්වහන්සේ මැවුම්කාරයා පමණක් නොව, උන්වහන්සේ ආත්මයක්ය **(යොහාන් 4:24)**. ඔබ මා මෙන් උන්වහන්සේ ශරීරයකට සීමා වී නැත. දෙවියන්වහන්සේ ආත්මයක්ය. එකම මොහොතක සෑම තැනකම සිටීමට උන්වහන්සේට හැකිය.

දෙවියන්වහන්සේ වෙනස් වන්නේ නැත. "**මම ස්වාමීන්වහන්සේය, වෙනස් නොවෙමි" (මලාකි 3:6)**. බයිබලය එසේ පවසයි. සියවස් ගණනාවක් තිස්සේ උන්වහන්සේ වෙනස් වී නොමැත. **"උන්වහන්සේ කිසි වෙනස්වීමක් හෝ හැරීමේ ඡායාවක්වත් නැත්තා වූ" (යාකොබ් 1:17)**.

බයිබලය අපට උගන්වන්නේ දෙවියන්වහන්සේ ශුද්ධ වූ තැනැත්තා ලෙසය. **"ස්වාමීන්වහන්සේ ස්වකීය සියලු මාර්ග වලදී ධර්මිෂ්ඨය, ස්වකීය සියලු ක්‍රියාවලින් දයාවන්තය" (ගීතාවලිය 145:17)**. එමෙන්ම උන්වහන්සේ සියල්ලේ විනිශ්චයකාරයා ලෙසද බයිබලය පවසයි. **"තවද එක් වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබේ" (හෙබ්‍රෙව් 9:27)**. එසේම බයිබලය මෙසේද පවසයි. **"මක්නිසාද යහපතක් වේවා, නපුරක් වේවා, සියලු ක්‍රියාද සියලු**

**රහස් දේද දෙවියන්වහන්සේ විනිශ්චයට පමුණුවන සේක" (දේශනාකාරයා 12:14).** ඔබ කළ සියලු දේද, ඔබ සිතූ පැතූ සියලු දේද, ඔබගේ හදවතේ තිබූ සියලු චේතනාද, යම් දිනයක එළිදරව් වී විනිශ්චයට භාජනය වේ. යම් දිනක විනිශ්චය පැමිණෙනවා ඇත. එබැවින් පසුතැවිලි වී හැරෙන්න. මක්නිසාද විනිශ්චයක් තිබේ.

අපි රටක යුක්තියේ නීතිය කැඩූ විට දඩයක් හෝ වන්දියක් ගෙවීමට ඇත. එමෙන්ම අපි පරිසරය දූෂණය කළ විට ඊට සරිලන මිලක් ගෙවීමට ඇත. එමෙන්ම අප දෙවියන්වහන්සේගේ සදාචාරාත්මක හා ආත්මික නීති කැඩූ විට ඒ සඳහාද මිලයක් ගෙවීමට ඇත. එම මිලය නම් මරණයයි.

දෙවියන්වහන්සේ සියලු දේ දකින සේක. උන්වහන්සේ සියල්ල දන්නා සේක. ඒ සියල්ල උන්වහන්සේ සටහන් කර ගන්නා අතර එම සටහන් වලට බයිබලය පවසන්නේ "පොත්" ලෙසය. එම පොත්වල අපේ, මගේ සහ ඔබේ නම ලියවී ඇත. ඔබ මා කළ කී සිතූ පැතූ සියල්ල එම පොත් වල වාර්තාවලට අනුව සියල්ල විනිශ්චයට භාජනය වේ. ස්වර්ග යේ තවත් පොතක් තිබේ. එය ජීවන පොත නම් වේ. යම් කෙනෙක් තමන්ගේ පව් ගැන පසුතැවිලි වී ක්‍රිස්තුස්වහන්සේ වෙත හැරුණු මොහොතේම ඔහුගේ හෝ ඇයගේ නම බැටළු පැටවාණන්ගේ ජීවන පොතේ මුද්‍රණය වේ. (එළිදරව් 20:11-15). මම මගේ නම ජීවන පොතේ ලියා තිබෙන බව මේ මොහොතේ දනිමි. මගේ නම පමණක් නොවේ ඔබගේ නමත් ඒ ආකාරයට ජීවන පොතේ සටහන් වී තිබේද? ගැළවීම සඳහා වෙනත් මාර්ග යක් නැත. යේසුස්වහන්සේ පමණයි එකම මාර්ගය. එමෙන්ම විනිශ්චය දවසේදී කිසිවෙකුට මේ පොළොවේ කිසිතැනක සැඟවිය නොහැක. අප සියලු දෙනාම දෙවියන්වහන්සේගේ විනිශ්චයට හසු වේ.



මැවුම්කාර දෙවියන්වහන්සේගේ ප්‍රේමය ද, බව බයිබලය අපට උගන්වයි. දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන සේක. උන්වහන්සේ අප සියලු දෙනාටම ප්‍රේම කරන සේක. ඒ කොතරම්ද යත් තම පුත්‍රයාණන් අප උදෙසා කුරුසියක් මත මැරී උන්වහන්සේගේ ලේ වගුරවන තරමටය. උන්වහන්සේ එසේ කළේ ඔබ උදෙසාය. ඔබේ පාපකාරි සිතුවිලි, ක්‍රියාවන්, නපුරු චේතනාවන්, අයහපත් ක්‍රියාවන් ඇතුළු සියලු පාප උන්වහන්සේ කුරුසිය මතදී තමන් පිටට ගත්සේක.

ඔබගේ ජීවිතයේ තේරුම හා අරමුණ

වන්නේ දෙවියන්වහන්සේගේ නාමය මහිමය හා ගෞරවයට පත් කිරීමයි. එමෙන්ම උන්වහන්සේ සමඟ සහභාගීකම් පැවැත්වීමයි. ඔබ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් සාදන ලදී. ඔබ ක්‍රිස්තුස්වහන්සේ වෙත හැරෙන විට, උන්වහන්සේ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ඔබගේ හදවත තුළට පැමිණෙන සේක. ඉන්පසු ඔබව ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට පත් කරන සේක. එමෙන්ම යම් දිනක ඔබ උන්වහන්සේ සමඟ ජීවත් වීම උදෙසා සදාකාලයට ඇතුල් වේ. මක්නිසාද උන්වහන්සේ අප උදෙසා කුරුසියේ මළ සේක.

බලන්න, උන්වහන්සේ අප මැවූ සේක. ඉන්පසු ඒදන් නම් ඉතා අත්‍යාලංකාර උයනක අප පදිංචි කළ සේක. එහිදී මනුෂ්‍යයා හා දෙවියන්වහන්සේ ඇසුරු කළ අතර දෙවියන්වහන්සේ එහි තිබෙන **"යහපත හා නපුර දැන ගැනීමේ ගසෙන් නොකන ලෙසත්, මන්ද එයින් කන දවසේදී ඔබලා මිය යාමට පටන් ගනී"** පැවසූ සේක.

දෙවියන්වහන්සේ තහනම් කළ ගසේ පළතුරු මිනිසා කෑමට පටන් ගත් අතර, එමගින් ඔහු දෙවියන්වහන්සේට විරුද්ධව කැරලි ගැසුවේය. මම දෙවියන්වහන්සේ කියන විදිහට ජීවත් වන්නේ නෑ. මම මගේම ගමනක් යනවා. මම මගේම ලෝකයක් ගෙඩනගා ගන්නවා. මට දෙවියන්වහන්සේගේ අවශ්‍ය වන්නේ නෑ යැයි කීවේය. (**උත්පත්ති පරිච්ඡේදයේ 1 සිට 3 දක්වා**). මේ ආකාරයට උන්වහන්සේගේ නීතිය අප කඩා තිබෙන බව බයිබලය අපට උගන්වයි. එය "පාපය" ලෙස හඳුන්වයි. මෙයට බයිබලය කියන්නේ **"නොපනත්කමේ අභිරහස දැනටත් ක්‍රියා කරන්නේය"** (**2 තෙසලෝනික 2:7**) ලෙසය. එමෙන්ම සෑම තැනකම අයුතුකම, දික්කසාදය, පවුල් ආරවුල්, මත්ද්‍රව්‍යය, දිළිඳුකම, ත්‍රස්තවාදය, කාමුක විකෘත්තිය, වැනි පාපකාරී හා විනාශකාරී දේ අපට දකින්නට ලැබේ. දෙවියන්වහන්සේ පොළොව දෙස බලා පවසන්නේ, **"පසුතැවිලි වී හැරෙන්න, විනිශ්චය පැමිණීමට නියමිතය"**.

දෙවියන්වහන්සේ පොළොව දෙස බලා මෙසේ පැවසූ සේක. මාංශමය වූ සියල්ලෝ පොළොවෙහි තමන්ගේ මාර්ග දූෂ්‍යකරගෙන සිටී (**උත්පත්ති 6:12**). ඔබ කවදා හරි එක බොරුවක් හෝ කියා තිබේද? නැතහොත් යම්කෙනෙකු රවටා තිබේද? එක නීතියක් කඩා තිබේනම් දෙවියන්වහන්සේ ඉදිරියෙහි අප වැරදිකාරයෝය (**යාකොබ් 6:23**). අපි සියල්ලෝම වැරදිකරුවෝය.

දසපනතෙහි එක් නීතියක් හෝ කඩ

කිරීම ගැන මම වරදකරුවෙකි. මට සුදුසු වන්නේ දඬුවමයි. මට සුදුසු විනිශ්චයයි. මට නියමව තිබෙන්නේ අපායයි. මගේ පාපය හා ඔබගේ පාපය නිසා අප දෙවියන්වහන්සේගෙන් වෙන් වී ඈත් වී සිටිමු. එමෙන්ම අපිට තනිකම හිමි වී ඇත. මම කෙනෙකු සමඟ මිත්‍රත්වයෙන් වෙන්වී සිටිනවා නොව දෙවියන්වහන්සේගෙන් වෙන් වී තනිවී සිටිනවා ඇත. ඔබ මැව්වේ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් හා උන්වහන්සේ සමඟ ආශ්‍රය කිරීමටය. ඔබ කවදා හෝ ඉහළ පෙළේ ප්‍රිය සම්භාශණයක සිටින විට එක වරම තනිකම දැනී තිබේද? එය කුමක්ද එය දෙවියන්වහන්සේ ඔබ සමඟ නැති තනිකමයි. ඔබ දෙවියන්වහන්සේ සමඟ පුද්ගලික සම්බන්ධතාවයක් ආරම්භ කරන තුරුම මේ තනිකම ඔබ ලුහුබඳිනවා නියතයි. එතනින් නොනැවතී, අපාය නොහොත් නිරය ඔබ ඉදිරියට පැමිණෙනු ඇත. ඇයි අප කියන්නේ අපායක් තියෙනවා කියලා. ඔබ අපාය විශ්වාස කරනවාද? කෙසේ වෙතත් බයිබලය පවසන්නේ අපායක් තිබෙන බවය. මම අපාය නොහොත් නිරය පිළිබඳ විස්තර කරන්න දැන් අවස්ථාව නොගනිමි. එමෙන්ම යක්ෂයා එහි සිටින බව හෝ ඔහු එහි ප්‍රධානියා බව නොපවසමි. යක්ෂයා කවදාවත් අපායේ සිටියේ නැත. නමුත් මතු දවසක යක්ෂයා අපායට යෑමට නියමිතය.

අප සියලු දෙනාම දිනක මරණයට පත්වනු ඇත. ඔබගේ ශරීරය මරණයට පත් වේ. ඔබගේ ප්‍රාණය හා ආත්මයද එසේම මිය යනු ඇත. දැනටත් මගේ ආත්මය දෙවියන්වහන්සේ නොදන්නා නිසා මියගොස් ඇත. මරණ දෙකක් ඇත. එකක් ස්වභාවික මරණය, අනෙක සදාකාලික මරණය. ඔබ ජීවත්ව සිටින කාලය තුළ ක්‍රිස්තුස්වහන්සේ අදහාග ැනීමට තීරණය කළ යුත්තේ එබැවිනි. මම ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කළොත් ස්වභාවික මරණයෙන් පසු ක්‍රිස්තුස්වහන්සේ වෙත පැමිණිය හැක. ඔබගේ පාප වැරදි සමතයකට පත් කිරීමට උන්වහන්සේට හැකිය. අප නොදැනුවත්වම අපගේ වේලාව පැමිණේ. අප මැරෙන දවස හෝ වේලාව කිසිවෙකුට පැවසිය නොහැක. නමුත් කිනම් මොහොතකදී හෝ ඔබ මරණයට පත් වේ. මරණය අප සැමවිටම නියමිතව තිබේ. (හෙබ්‍රෙව් 9:27). සදාකාලික මරණය නොහොත් ආත්මික මරණයක් ඇත. ඔබ බොහෝ දෙනෙක් ආත්මිකව දැනටමත් මැරී සිටියි. එහි අර්ථය නම් ඔබගේ ආත්මය හා ප්‍රාණය දෙවියන්වහන්සේ වෙතට මැරී තිබීමයි. දෙවියන්වහන්සේ සමඟ කිසිම සම්බන්ධයක් නොමැත. උන්වහන්සේ සමඟ ආශ්‍රයක් ගමන් කිරීමක් නොමැත. සමහරවිට ඔබ ඉරිදා සභාවට යනවා විය හැක. බෞතීස්මය ලබා ස්වාමීන්ගේ මේසයටත් පංගුකාරකම් දක්වනවා

ඇත. නමුත් ඔබගේ හදවතේ ගැඹුරින් ක්‍රිස්තුස්වහන්සේව නොදැන සිටිනවා විය හැක. උන්වහන්සේ ඔබගේ හදවතේ වැඩ නොසිටිනවා විය හැක. ඒ පිළිබඳ පූර්ණ විශ්වාසයක් ඔබට නොතිබෙන්නට පුළුවන. ඔබ මෙය ඔබගේ පාපයට



ක්‍රිස්තුස්වහන්සේ සමාව දී ඇති බව ඔබට සහතිකයක් නොතිබිය හැක. **"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය"**.

ඒ ඔබ විය හැක. ඔබට අලුත් පුද්ගලයකු බවට පත් විය හැක. අලුත් පුද්ගලයෙක්! අලුත් ස්ත්‍රියක්! ඒ සඳහා ඔබගේ ඇදහිල්ල විශ්වාසය ක්‍රිස්තුස්වහන්සේ මත තබන්න. දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන සේක. දෙවියන්වහන්සේට අවශ්‍යයි ඔබට සමාව දෙන්න. උන්වහන්සේට අවශ්‍යයි ඔබගේ හදවතට පැමිණෙන්න. ඔබව උන්වහන්සේ දරුවකු ලෙස නැවත පිළිගැනීමට උන්වහන්සේට අවශ්‍යයි.

**"යේසුස්වහන්සේ ස්වාමීන්වහන්සේ යැයි නුඹේ මුඛයෙන් ප්‍රකාශකරන්නෙහි නම්, උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම්, නුඹ ගලවනු ලබන්නෙහිය" (රෝම 10:9).**

ඔබ මෙසේ කිරීමට කැමතිද? ඔබගේ හදවත විවෘත කර උන්වහන්සේ ඔබගේ හදවතට පිළිගැනීමට ඔබ කැමතිද?

එසේනම් දෙවියන්වහන්සේ ප්‍රේමය පිළිබඳව වඩ වඩා කතාකරන මේ නත්තල් සමයේදී ඔබගේ හදවත යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ට විවෘත කර උන්වහන්සේව අලුතින් ජිවිතයට පිළිග න්න. 2025 වසරට අලුත් පුරුෂයකු, අලුත් ස්ත්‍රියකු ලෙස පා තබන්න. ඔබ සැමට සුභ නත්තලක් හා සුභ නව වසරකට ආශිර්වාදය පතමි.

- සංස්කාරක -
**එස්. මෙත්තානන්ද**
**077 8813197**

# දෙවියන්වහන්සේගේ පොරොන්දු වල ඇති වැදගත්කම



පොරොන්දුව යන වචනය ඇසූ විට ඔබේ මතකයට නැගෙන්නේ කුමක්ද? ඒ තවමත් ඔබට ඉටුකරන්නට නොහැකිවූ පොරොන්දුවක් ගැන හෝ ඔබේ ජීවිතයේ ඉටු නොවූ පොරොන්දුවක් ගැන විය හැකියි. පොරොන්දුවක් එක් පාර්ශවයක් විසින් තවත් පාර්ශවයකට, ඔවුන් වෙනුවෙන් ඉටුකරන බවට හෝ ඉටු කර දෙන බවට වන ප්‍රතිඥාවකි. මෙහි හොඳ හෝ නරක ලෙස දෙපැත්තක් තිබිය හැක. සැබෑවටම මනුෂ්‍යයා සම්බන්ධව නම් සියලු පොරොන්දු කඩවුණු පොරොන්දු වේ. නමුත් කිසිම ලෙසකින් තම පොරොන්දු අමතක නොකළ අප දෙවියන්වහන්සේගේ පොරොන්දු සදාකාලික වේ. ඒවා කිසි ලෙසකින්වත් කඩ වන පොරොන්දු නොවේ. උන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක. උන්වහන්සේගේ පොරොන්දු මත රඳා සිටීම ගැන හා එහි ආශිර්වාද ගැන සොයා බලමු.

ශුද්ධ බයිබලයෙහි සියළු පරිච්ඡේදයක්ම වාක්‍යයක්ම හා වචනයකම ගැබ්ව ඇති සියලු කාරණා කිතුණුවන්ට මඟ පෙන්වීමකි. දෙවියන්වහන්සේගේ අප හා සම්බන්ධ සදාකාලික අභිප්‍රාය නම් අපි ශුද්ධ වූ ජීවිතයක් ගත කිරීමයි. මෙම පවිත්‍ර ජීවිතය ගතකරමින් උන්වහන්සේගේ කැමැත්ත අප ජීවිත තුළ ඉටුවනු දැකීමයි. උන්වහන්සේ සමඟ ගමන්කරමින් උන්වහන්සේව ප්‍රසන්න කිරීමයි. කිතුනුවන් වන අප හැමට උන්වහන්සේ වෙත යන්නට ආශාවක් තිබෙනවා. ශරීරයෙන් වෙන්ව ක්‍රිස්තුස්වහන්සේ සමඟ සදාකාලයටම ජීවත්වීම (**2 කොරෙන්ති 5:8**) සේම, උන්වහන්සේ වළාකුල් මතට පැමිණ අපව රැගෙන යන බලාපොරොත්තුව (**1 තෙසලෝනික 4:14**) ද අපට තිබෙන නමුත් මෙම බලාපොරොත්තු සහ උන්වහන්සේගේ පැමිණීමේ පොරොන්දුව

අපි අමතක කරනවා. සාතන් අපව පරීක්ෂාවට ලක් කරමින් ලෝකයේ මායාවන් වලින් අප අන්ධකරමින් මේ උතුම් බලාපොරොත්තුව සහ පොරොන්දුව අපෙන් ඈත්කරන්නට උත්සහ කරනවා. මේ උත්සාහයෙන් අප බේරී සිටීමට නම් උන්වහන්සේගේ අනර්ඝ පොරොන්දු තදින් අල්ලා ගෙන, ඒවා විශ්වාස කරමින් ඒවා තුළ පිහිටා සිටිය යුතුය. දෙවියන්වහන්සේ සමඟ තිබෙන සම්බන්ධතාවයට මේ ලෝකයේ දේවලින් කිසිඳු බලපෑමක් නොවීමට වගබලා ගැනීම කිතුණුවාගේ වගකීමයි. උන්වහන්සේ ඔබ සහ මා මේ පොළොව මත තබා තිබෙන්නේ යම් අභිප්‍රායක් මතයි. අපේ වගකීම නම් මේ අභිප්‍රාය කුමක්දැයි සොයා දැනගැනීම සහ අරමුණක් සහ අභිප්‍රායක් සහිත ජීවිතයක් ගත කිරීමයි. සාමාන්‍යයෙන් මිනිසුන් කිසි අරමුණක් හෝ අභිප්‍රායක් නොමැතිව නිකරුණේ සිටිනවා. ඔවුන් ඒකාකාරී ජීවිතය තුළ දෙවියන්වහන්සේ පසෙකලා තම අරමුණු පස්සේ හඹා යමින් නිස්කාරණේ දුවමින් සිටිනවා. නමුත් කිතුණුවන් වන අපට මෙවැනි නිකරුණේ ජීවිත ගත කරන්නට බැහැ.

දේව කැමැත්තට අනුව ජීවත් වූ බොහෝ මනුෂ්‍යයන් ගැන බයිබලයෙහි සඳහන්ව තිබෙනවා. උන්වහන්සේ තුළ මෙවැනි



ශුද්ධවත් ජීවිත ගත කිරීමට ඔවුන් උන්වහන්සේ සමඟ සමීපව ජීවත්විය. අපිද උන්වහන්සේ සමඟ සමීපව ජීවත්විය යුතුය. අපටද උන්වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවය ගොඩනගාගත හැක්කේ යාච්ඤාව තුළිනි. උන්වහන්සේ අපට ජීවනය දෙමින්, උන්වහන්සේගේ පැමිණීම ප්‍රමාද කරමින් අරමුණක් ඇතිව ජීවත් වීමට අපට අවවාද කරන සේක. යාච්ඤා කිරීම, බයිබලය කියවීම, දේව වචනය මෙනෙහි කිරීම සහ එහි රැඳා පැවතීම අපගේ වගකීම සහ උන්වහන්සේගේ බලාපොරොත්තුවයි. උන්වහන්සේගේ පොරොන්දු ලබාගැනීම ට හා උන්වහන්සේගේ අභිප්‍රායන් දැන ගත හැකි මාර්ගය නම් දේව වචනය කියවීම හා මෙනෙහි කිරීමයි. **1 රාජාවලිය 8:56, හෙබ්‍රෙව් 10:23, 2 පේත්‍රුස් 3:9** යන දේව වචන කොටස් වල සඳහන් පරිදි දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දු ඉටු කිරීමට විශ්වාසවන්තව සිටින සේක. උන්වහන්සේගේ මෙම

අනර්ඝ විශ්වාසවන්ත භාවය අත්විඳීමට නම් අපට නැවුම් පිරිසිදු භාවයෙන් යුතුව දිනපතාම උන්වහන්සේ වෙතට ළඟා වීමට සිදුවෙනවා. උන්වහන්සේ අපට දී තිබෙන මෙම පවිත්‍රවීමේ බලය ගැන දැන, දෙවියන්වහන්සේ දී තිබෙන මහත් බලාපොරොත්තුව **යොහාන් 14:13** ඉටුවන තුරු බලා සිටිය යුතුය. උන්වහන්සේගේ අනර්ඝ පොරොන්දු මත කිතුණුවාගේ අනාගයේ සුරක්ෂිතභාවය සහතිකය කරයි.

පොරොන්දුවට පෙර පොරොන්දුව විශ්වාස කිරීමට ඔබේ සුදානම ගැන සිතා බලන්න. ඔබ උන්වහන්සේගේ වේලාව දක්වාම ඉවසා විශ්වාසවන්තව සිටීමට සූදානම්ද? නැතහොත් ඔබේ ඉවසීමේ අවසාන මොහොතේ වෙනත් සැලසුම් ක්‍රියාත්මක කරනවාද? අපේ සර්වබලධාරී දෙවියන්වහන්සේ උන්වහන්සේගේ නියම කාලයේදී ඔබට විපාක ලබා දෙන සේක. ඔබ උන්වහන්සේ දෙන විපාකය දෙස බලා සිටිය යුත්තේ **ගීතාවලිය 40:8** හි සඳහන් පරිදි **"මාගේ දෙවියන්වහන්ස ඔබගේ කැමැත්ත කරන්නට ප්‍රියවෙමි"** ලෙස දාවිත් කියූ ලෙසය. යේසුස්වහන්සේ මේ පොළොව මත සිටි කාලයේදී දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන්නට ප්‍රියව සිටි සේක. තම ස්වර්ගීක සිංහාසනය අතහැර මේ පොළොවට බැස ආවේ පියාණන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමටය. උන්වහන්සේ එය ඉටු කළ සේක. එම කීකරුකම තුළින් ඔබටත් මටත් පාප කමාව ලැබී අප ස්වර්ගීය ජීවනයට උරුමය ලැබුවෝ වීමුව.

දෙවියන්වහන්සේගේ අභිප්‍රාය ඉටුකරමින් උන්වහන්සේගේ පොරොන්දු විශ්වාස කරමින් ඒවා වැළඳ ගැනීමට සූදානම් වෙමු.

**- මොහාන්ලාල් ගුණවර්ධන -**

**සහෝදරයාගේ දේශනාවක් ඇසුරෙන් සකස් කලේ ශෂිලා ද සිල්වා.**

# ශුද්ධකමින් මහිමාන්විත වූ ප්‍රශංසාවෙන් භයංකර වූ පුදුම දේ කරන්නාවූ උන්වහන්සේ මෙන් සිටින්නේ වෙන කවුද?



**"අපි ස්වාමින්වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටී."** යන කියමන එදා මෙදා තුර කිතුණුවන් වන අප, ඔබ අසා ඇති බව නොඅනුමානයි. නමුත් මෙම කියමන ඇත්තක්ද? සත්‍ය වශයෙන්ම එම පැමිණීම අප බලාපොරොත්තුවෙන් සිටී ද? මැද පෙරදිග ඊශ්‍රායෙල් රට තුළ අද මේ මොහොතේ සිදුවන්නා වූ දේ පිළිබඳ ව බොහෝ දෙනාගේ අවධානය යොමුව කතාබහට ලක් වී ඇත. ඒ මන්ද එම අනාගත වාක්‍යය මෙම දින වල ඉටුවෙමින් පවතින බැවිනි.

නමුත් අපගේ ස්වාමී වූ යේසුස්වහන්සේ, කිසිදු අනතුරු හැඟවීමකින් තොරව හදිසියේම, බලාපොරොත්තු නොවන මොහොතකදී උන්වහන්සේ එන බව උන්වහන්සේ පැවසූ සේක. උන්වහන්සේ රාත්‍රියේ පැමිණෙන සොරෙකු මෙන් පැමිණෙන බවට සමාන කරමින් ඉගැන්වූ සේක. යේසුස්වහන්සේ, එනම් මෙසියස්වහන්සේ දාවිත් ගේ සිහසුන මත රජකම් කරන්නට යෙරුසලමට පැමිණෙන බව කිසිමදාක රහසක් නොවීය. එය පරණ ගිවිසුමේ ලියැවී තිබුණි. එය ඊශ්‍රාලිතයන් දැන සිටියහ. එම ලියවිලි කිය වූ හැමදෙනාමත් ඒවා දැන සිටියහ.

**ගීතාවලිය 2:6** හි මම මාගේ ශුද්ධ කන්ද මතුයෙහි මාගේ රජ්ජුරුවන් පිහිටුවන බව දෙවියන්වහන්සේ පැවසූ සේක. මෙම පදයෙන් ආරම්භ වී පරණ ගිවිසුම පුරා පද ගණනක් තුළින් මෙම මෙසියස්වහන්සේ පැමිණ දාවිත්ගේ සිහසුන පිට රජකම් කරන බවට ලිය වී ඇත. එවැනි පද කිහිපයක් පහත සඳහන් වේ,

- ⋆ **ගීතාවලිය 45:5,6**
- ⋆ **ගීතාවලිය 47:2,9**
- ⋆ **ගීතාවලිය 48:1,2**
- ⋆ **ගීතාවලිය 72:11**
- ⋆ **ගීතාවලිය 96:13**
- ⋆ **ගීතාවලිය 98:9**
- ⋆ **ගීතාවලිය 110:5,6**
- ⋆ **යෙසායා 9:6**
- ⋆ **යෙසායා 11:1-10**
- ⋆ **යෙසායා 32:1**
- ⋆ **යෙසායා 42:1**
- ⋆ **යෙසායා 65:19-25**
- ⋆ **යෙරෙමියා 23:5,6**
- ⋆ **යෙසායා 33:15**
- ⋆ **මීකා 4:1-4**
- ⋆ **සෙකරියා පොතෙහි පද බොහෝමයකි.**

පරණ ගිවිසුමෙහි උප්පත්ති පොතෙහි සිට මලාකි පොත දක්වාම දෙවියන්වහන්සේගේ මෙසියස්වහන්සේ පැමිණ රජකම් කිරීම පිළිබඳව සඳහන් කර තිබේ. මීළඟට අලුත්

ගිවිසුමෙහිද මෙසියස්වහන්සේ පැමිණ මේ පොළොවෙහි රජකම් කිරීම පිළිබඳ සඳහන් වේ. උදාහරණ කිහිපයක් ලෙස

- ⋆ **ශු. මතෙව් 24:30** ⋆ **එළිදරව් 1:7**
- ⋆ **ශු. මතෙව් 25:31** ⋆**2 තෙසලෝනික 1:7**
- ⋆ **එළිදරව් 20 - පරිච්ඡේදයෙහි එම රජකම් කිරීමේ කාලය වසර දාහක් බව කියැවේ.**
- ⋆ **එළිදරව් 20:1-7 අවුරුදු දාහක් ලෙස එම කාලසීමාව සය වතාවක් ලිය වී ඇත.**

මේ අනුව මෙය දෙවියන්වහන්සේගේ ප්‍රසිද්ධ ප්‍රකාශයකි. එනම්, උන්වහන්සේ පොළොවෙහි රජකමක් ස්ථාපිත කිරීමට යන බවයි. පාවුල් තුමා විසින් ශුද්ධාත්මයෙන් පොළඹවනු ලැබ ආනුභාවය ඇතුව අපට එළිදරව් කර දීමට රහසක් ඇති බව ප්‍රකාශ කර ඇත. එම ප්‍රකාශය **1 කොරින්ති 15:51** හි සඳහන් වේ. පාවුල් තුමා විසින් මෙතෙක් කලක් සැඟ වී තිබුණු අභිරහසක් රහසක් ලෙස කිතුණු අපට එළිදරව් කර පෙන්වා දී තිබෙනවා. මෙම සිදුවීම පිළිබඳව ඔහු පරණ ගිවිසුම් ලියවිලි වලින් පද ගෙන හැර නොදක්වයි. මන්ද පරණ ගිවිසුම් කාලයෙහි සැඟ වී තිබුණු දෙයකි. එය කුමක්ද? එය ශුද්ධවන්තයන්ගේ රූප මාරුවීමක් පිළිබඳව ය. ඔහු පසුව එම රූප මාරුව සිදුවන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශ වීමේ මොහොතේ බවත්, එය රහසක් බවත් විස්තර කරයි. ඔහු පවසන මෙම සිද්ධිය යේසුස්වහන්සේගේ රජකමට පොළොවට පැමිණීම ගැන නම් එය රහසක් නොවන බව ඔබත්, මමත් දන්නා කරුණකි.

මන්ද එය කවුරුත් දන්නා ප්‍රසිද්ධ රහසක් වන අතර එම සිදුවීම පරණ ගිවිසුම කියැවූ පුද්ගලයන් පවා බලාපොරොත්තුවෙනුත් සිටියහ. නමුත් මෙය සභාවට පමණක්ම එළිදරව් කර දෙන්නා වූ අභිරහසකි.

පාවුල් තුමා මෙය වඩා හොඳින් ඔහුගේ පළමු ලියවිල්ලේ එනම්, **1 තෙසලෝනික 4:13-17** හි සඳහන් කර ඇත. අපේ යේසුස්වහන්සේ තමන්ගේ දෙවැනි පැමිණීම තම ශුද්ධවන්තයන් ව රැගෙන යාමට පැමිණීම පිළිබඳ ව උන්වහන්සේ සඳහන් කළ බව සුභාරංචි පොත් වල සඳහන් වේ. නිශ්චිත ලෙස **ශු. මතෙව් 24 පරිච්ඡේදයෙහි** එකෙක් ගනු ලබන බවත් අනෙකාව අත්හරින බවත් සඳහන් වේ. **ශු. මතෙව් 24 හි** යේසුස්වහන්සේ අනාගතය පිළිබඳ සැලසුමක් කෙටියෙන් සඳහන් කර ඇත. ඒ උන්වහන්සේ ඇදහිලිවන්තයන්ව ඔසවා ගැනීමට පැමිණෙන බවත්, උන්වහන්සේ සියල්ලන්ට එළිදරව් වීමට පැමිණෙන බවත් යන පැමිණීම් දෙකම පිළිබඳව **ශු. මතෙව් 24**හි වෙන වෙනම සඳහන් කර ඇත. නමුත් අපගේ අවබෝධය අඩුකම නිසාම සමහර අවස්ථාවන්හීදී මේ දෙකම එකක් ලෙස අප අවබෝධ කර ගනී.



**ශු. මතෙව් 24:29,30** පද වල එම පීඩා කාලය අවසන් වූ වහාම ඉර අඳුරු වන බවත්, මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණ අහසේ දිස්වෙන්නට යන බවත් සඳහන් වේ. එහි

බලාපොරොත්තුවකින් තොරව හදිසි පුදුම වීමක් ගැන අදහසක් සඳහන් නොවේ. පීඩා කාලය අවසන් වූ පසු ඉර අඳුරුවීම, ඉන්පසු මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණ අහසේ දිස්වීම ලෙස සඳහන්ව ඇත.

නමුත් එම පරිච්ඡේදයේම කිසිම අනතුරු ඇඟවීමකින් තොරව හදිසියේම පැමිණීම පිළිබඳව යේසුස්වහන්සේ සඳහන් කර ඇත. **ශු. මතෙව් 24:44** හි ඇදහිලිවන්තයාට අනතුරු ඇඟවීමක් සඳහන් වේ. ඒ ඕනෑම මොහොතක සූදානම් ව සිටින ලෙස ය. එය පරණ ගිවිසුමෙහි සඳහන් නෝවාගේ කාලයෙහි ජල ගැලීමට සමාන බව පවසයි. නෝවා ගේ කාලයෙහි කිසි විපතක් එන බවට කිසිඳු අයෙක් බලාපොරොත්තු නොවූ බවත්, නෝවා නැවට ඇතුළු වූ දවසේ ජලගැල්ම පැමිණි බවත් උන්වහන්සේ පැවසූ සේක. එම නිසා දේව වචනය අවධානයෙන් යුතුව මීට පෙර සිතට මුල් බැස ගත් අදහස් නැතුව කියවීමෙන් මෙහි පැමිණීම් 2 ක් ඇති බව තේරුම් ගත හැකිය.

01. කිසිඳු අනතුරු ඇඟවීමකින් තොරව හදිසියේම බලාපොරොත්තු නොවන මොහොතක උන්වහන්සේගේ පැමිණීම.
02. යම් සිදුවීම් මාලාවක අවසානය වශයෙන් උන්වහන්සේගේ පැමිණීම.

මේ නිසා අද අපි විශේෂයෙන් අවධානයක් දිය යුතු පදය ලෙස **ශු. මතෙව් 24:42** පදය මම යෝජනා කිරීමට කැමැත්තෙමි. මෙම කාරණා නිවැරදිව තේරුම් නොගැනීම නිසා ඇදහිලිවන්තයන් විසින් තමා සූදානම්ව සිටීම පිළිබඳව අතපසු කරගෙන ඇත, නොසලකා හැර ඇත. ක්‍රිස්තුස්වහන්සේ පැමිණීමට පෙර මෙම අනාගත වාක්‍යය ඉටු විය යුතු බව සිතා මෙම අනාගත වාක්‍යය ඉටුවන තුරු බලා සිටියි.

මෙම පරිච්ඡේදයෙහි 24:40,41 පද වල ලූක් පොතෙහි සඳහන් පරිදි සාමාන්‍ය දිවියක් ගෙවන අතරතුර එනම් දෙදෙනෙකු කෙතෙහි වැඩ කරමින් සිටියි, දෙදෙනෙක් නිදා සිටී. සාමාන්‍ය එදිනෙදා කාලයන් ගත කරන අතරතුර යේසුස්වහන්සේ හදිසියේ පැමිණීම ගැන එහි විස්තර කෙරේ. එම නිසා සභාව ඔසවා ගැනීම, ශුද්ධවන්තයන්ගේ මහිමයට පත් කරනු ලැබීම යන මෙම සිදුවීම් අත්හැර දැමීම නිසා ඇදහිලිවන්තයන්ට ජයග්‍රාහී ජීවිතයක් ගෙන යාමට නොහැකි වේ. උන්වහන්සේගේ එම සිද්ධිය දේව වචනයට අනුව ස්ථිරවම ස්ථාපිත කරනු ලැබූ ඉගැන්වීමක් ලෙස පවතී. කණගාටුදායක ලෙස ලෝකය පුරා සිටින්නා වූ කිතුණුවන්ට උන්වහන්සේගේ රජකම් කිරීමට පැමිණීම ගැන පමණක් සඳහන් කර රහසිගත පැමිණීම සම්පූර්ණයෙන්ම අමතක කර දමා ඇත. මෙම සිදුවීම අනිවාර්යයෙන් යම් පරම්පරාවකදී සිදු විය යුතුය. මෙය අපගේ පරම්පරාවේදී සිදුවිය යුතු බවට අප ආශා කළ යුතුය. ඉතින් මෙය අපගේ පරම්පරාවේදී සිදු වන බව විශ්වාස කරමු. එය බලාපොරොත්තුවෙන් සිටිමු.

**- නෙවිල් ජයසුන්දර -**
**සහෝදරයාගේ දේශනාවක් ඇසුරෙන්**
**සකස් කළේ**
**- අමන්දි විතානගේ -**

# නත්තල පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?



නත්තල පිළිබඳ ව ඔබගේ අදහස කුමක්ද? ක්‍රිස්තුස්වහන්සේ උපන් ස්ථානය, දාවිත් ඉපදී හැදී වැඩුණු රාජකීය නුවර බෙත්ලෙහෙම, ගව මඩුව, තානායම, එඬේර තරුව සිතන විට නත්තල් කතාවට සම්බන්ධ වූ සමහර පුද්ගලයින් ගැන අපි අවධානය යොමු කළ යුතුය.

වර්තමානයේ අප යෝසෙප් ට දෙන අවධානය අඩුය. ඔහු හඳුන්වනු ලබන්නේ "ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු" ලෙසය. නැතිනම් "දෙවියන්වහන්සේගේ කැමැත්තට" සම්පූර්ණයෙන්ම අවනත වූ භක්තිවන්ත පිරිමියෙකි. කරුණාවන්ත හා භක්තිවන්ත ගුණාංග සමඟ ඔහු දෙවියන්වහන්සේට හා මරියාට තිබූ කැපවීම මෙයින් පෙන්නුම් කෙරේ. යොසෙප්, මරියා සමඟ විවාහ ගිවිසගෙන සිටි අතර, මරියා දරුවකු ලැබීමට සිටි බව ඔහු දැනගත්තේය. නමුත් ඔහුට මරියාට අපහාස නින්දා කර ඇය ඔහුට "ද්‍රෝහිකමක්" කර ඇති බව නෑදෑයින්ට හා අන්‍යයට කියා ඇයව ප්‍රසිද්ධියේ අපහසුතාවයට පත් කිරීමට ඉඩ තිබුණි. නමුත් ඔහු එසේ කළේ නැත. මන්ද දේවදූතයෙක් ඔහුට එළිදරව් වී දෙවියනවහන්සේගේ පණිවිඩයක් ඔහුට දන්වා තිබුණි. "**නුඹේ භාර්යාව වූ මරියා පාවා ගන්න බයවෙන්න එපා. මක්නිසාද ඈ තුළ පිළිසිඳුනා වූ යමක් ඇත්ද එය ශුද්ධාත්මයාණන් කරණකොටගෙනය. ඈ පුත්‍රයෙකු වදන්නීය. උන්වහන්සේට යේසුස් යන නම තබන්න. මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාප වලින් ගලවන්නේ උන්වහන්සේය" (මතෙව් 1:20-21).** මෙය සත්‍යය යැයි විශ්වාස කිරීමට යොසෙප් නම් මෙම තරුණ කොලුගැටයාට දෙවියන්වහන්සේ කෙරෙහි මොනතරම් ඇදහිල්ලක් හා විශ්වාසයක් තිබුණාද?

දැන් මරියා දෙස බලන්න, ඇය ඉතාම තරුණ වයසේ පසු වූ යෞවනියකි. බොහෝ දුරට අවුරුදු 20ට අඩු විය හැක. නමුත් ඇය දෙවියන්වහන්සේ කෙරෙහි දැඩි ඇදහිල්ලක් ඇතිව සිටියාය. ඇයට දරුවකු ලැබීමට සිටින බව ඇයවත් දැන සිටියේ නැත. ඒ බව ගාබ්‍රියෙල් නම් දේවදූතයා විසින් ඇයට දන්වන ලදී. **බොහෝ කරුණාව ලැබූ තැනැත්තිය, ශුභසිද්ධ වේවා; ස්වාමින්වහන්සේ නුඹ සමඟ සිටින සේක්වා! (ලූක් 1: 28- 30).**

ඇයට ලැබුණේ කුමන ආකාර කරුණාවක්ද? එහි ප්‍රතිඵලය කුමක්ද? ඒ ආකාර කරුණාවක් ලබා ගැනීමට අද අප සියලු දෙනාම මැලි වනු ඇත. ඇය වෙහෙස මහන්සියෙන්, දරිද්‍රතාවයෙන් පිරි කුඩා නගරයකට යෑමට තිබුණි. එහිදී ඇයට දරු ප්‍රසූතියේ වේදනාව දැනුණි.

නවාතැන්පොළේ ඉඩ නැති විය. ගවයන් ගාල් කරන මඩුවක දරුවා බිහි කරන්නට ඇයට සිදු විය. ඉන්පසු ඊජිප්තුවටත්, නාසරෙත් නුවරටත් ගමන් කළ ඇය අනාගතය පිළිබඳ අවිනිශ්චිත හැඟීමකින් වසර ගණනාවක දිගු ගමනක් ගමන් කර, අවසානයේ තම පුත්‍රයා රුදුරු කුරුසියක ඇණ ගසනු බැලීමට සිදු විය. මෙන්න දෙවියන්වහන්සේගෙන් ඇයට ලැබුණු කැඳවීම, ඇය වෙත ලැබුණු දෙවියන්වහන්සේගේ කරුණාව ඒ ආකාර විය.

සමහර විට ඔබ දුක්විඳීම් තුළින් ගමන් කරනවා විය හැක. එය දෙවියන්වහන්සේගේ කරුණාව විය හැකිද? මේ නත්තලේ සමහර විට ඔබ ආදරය කරන අයෙකුගේ මරණය, රැකියාව අහිමිවීම්, මුදල් අඟහිඟකමක්, තදබල අසනීප තත්ත්වයක්, මානසික පීඩාවක් හෝ වෙන යම් කුමන දෙයක් වුවත්, එය ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ "කරුණාව" විය හැකිය. මන්ද දෙවියන්වහන්සේ පරමාධිපති වන අතර ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ අහම්බෙන් කිසිවක් සිදු නොවේ. ඔවුන්ගේ ජීවිතයේ සිදුවන සෑම දෙයක්ම උන්වහන්සේගේ අනුග්‍රහය යටතේ පවතී. ක්‍රිස්තුස්වහන්සේ සමඟ වැඩි වශයෙන් සම්බන්ධ වීමට හා උන්වහන්සේට වඩාත් සමීප වීමට මේ සියල්ල විශාල පියවරක් හා රුකුලක් විය හැකිය. යම් පුද්ගලයෙකුට දෙවියන්වහන්සේ කරුණාව ලබා දෙන්නේ පොහොසත්කමින් නොව ඇදහිල්ල ඉතා අධික ලෙස සෝදිසි කරන පරීක්ෂණයක් තුළිනි. එය මහත් අභියෝග සහිත පරීක්ෂණයක් විය හැකිය.

**ලූක් 15** පරිච්ඡේදයේ යේසුස්වහන්සේ සඳහන් කළ පුදුමාකාර කතා තුනෙහි පවසා ඇති දේ බලන්න. දේවදූතයන් හා ඔවුන්ගේ ප්‍රීතිය සලකා බලන්න. එක් පව්කාරයෙකු පසුතැවිලි වන විට ස්වර්ගයේ මහත් ප්‍රීතියක් ඇති වන බව එහි සඳහන්ය. එක් පව් කාරයෙකු පසුතැවිලි වී යේසුස්වහන්සේ වෙතට පැමිණීමෙන් මෙන්ම ඇදහිලිවන්තයෙකු තම ඇදහිලි පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වී ස්වාමින්වහන්සේට යටත් වන විටදී ද යේසුස්වහන්සේ මෙලොව ඉපදුන දවසේ ස්වර්ගයේ සේනාව ප්‍රීති වුණාක් මෙන් ප්‍රීති වනු ඇත.

උන්වහන්සේ මෙලොවට පැමිණියේ ඉපදීමට පමණක් නොවේ. මරණය විඳීමටත් ය. උන්වහන්සේ මරණය විශ්වය ආරම්භ වීමට පෙර සැලසුම් කරන ලදී. පළමු නත්තල් රාත්‍රියේ පණිවිඩය මෙයයි. **"උන්වහන්සේට යේසුස් යන නම තබන්න. මක්නිසාද උන්වහන්සේ තම සෙනඟ ඔවුන්ගේ පාප වලින් ගලවන සේක" (මතෙව් 1:21).**

දැන් අපි එඬේරුන් වෙත අවධානය යොමු කරමු. පළමුව ඔවුන් භය වූහ. ඔවුන් දීප්තිමත් ආලෝකය දැක, දේවදූතයන්ගේ හඬ අසා ඔවුන් බියට පත් වූහ. දේවදූතයා ඔවුන් පැවසූ පළමු දෙය නම් "භය නොවන්න" (**ලූක් 2:10**) නත්තල් කතාවේ හතර වතාවක් "භය නොවන්න" යැයි සඳහන් වේ.

අප ජීවත් වන ලෝකය භීතියෙන් වෙව්ලයි. ලෝකයේ අවට සිදුවන දේ කරණකොට ගෙන භයෙන් පසු නොවන ලෝක නායකයෙකු සිටී දැයි සිතා ගත නොහැකිය. රට රට වල සිදු වන දෑ හා ලෝක නායකයන් පවසන දේ විග්‍රහ කිරීමේදී අපට බියජනක හැඟීම් දැනේ.

බිය නොවන්න! දෙවියන්වහන්සේ රජකම්

කරන සේක! දෙවියන්වහන්සේ ස්වාධිපත්‍යය වූ තැනැත්තා වන සේක. උන්වහන්සේට ලෝකය ගැනත් අප ගැනත් සැලැස්මක් ඇත. මේ දැනුත් එය ක්‍රියාත්මකයි. අපි දැන් **යෙසායා 43** පරිච්ඡේදයේ බලමු. " **මම නුඹ මැව්වෙමි! මම නුඹ සැදුවෙමි! මම නුඹ මිදුවෙමි! බය නොවන්න ! මම නුඹ සමඟ සිටිමි! විපත්තිය නැමැති විල මැදින් යන විට මම නුඹ සමඟ සිටිමි. (යෙසායා 43: 1-2** ) අපගේ පුද්ගලික ජීවිතයේ වේවා! රටක් ලෙස වේවා! ලෝකයක් ලෙස වේවා! උන්වහන්සේ සෑම කල්හිම අප සමඟය.

මීට වසර 2024 කට පමණ පෙර පළමු නත්තල් දවසේදී ප්‍රධාන සංසිද්ධි තුනක් ලෝකය අත් දැක්කේය.

## පළමු සංසිද්ධි

**තරුව!** බොහෝ තරු අහසේ බබළයි. එහෙත් මෙම තරුව අද්විතීයයි! මෙය මහත් ආලෝකයෙන් හා දීප්තියෙන් බැබළුණි. එය හරියටම අහස නැමැති සිවිලිමෙන්, කැළඹිලි නැමැති අඳුරු ආලෝකය මතට විශාල බල්බයක් දැමුවා සේ ය. එනම් ලෝකයාගේ පාපය නැමැති ඝන අඳුර දුරු කරන ගැලවුම්කරුවා ලෝකයට එසේ බිහි විම ඒ තරුව සනිටුවහන් කළේය. **(මතෙව් 2:2).**

## දෙවන සංසිද්ධි

**අලුත් ගීතිකාව! (ලූක් 2:13-14).** වා තලයට ස්වර්ගික සේනාව ගායනා කරන ලද අලුත් ගීතිකාවක් මුසු විය. මිහිරි ප්‍රශස්ති ගීතිකා ගායනා කිරීම අමතක වී, අහිමි වී තිබූ ලෝකය නැවතත් ප්‍රීති ගීතිකා ගායනා කිරීමට පටන් ගත් සේම එසේ කිරීමට ඉගෙන ගත්තේය. දෙවියන්වහන්සේ මාංශවත් වී මිනිසුන් අතරේ වාසය කිරීමට පැමිණීමත් සමඟම ඔවුන්ගේ හදවත් තුළ බලාපොරොත්තුව ඇති විය. දේවදූතයන් විසින් මෙහෙයවන ලද ගායනා කණ්ඩායම **"ඉතා උසස් තැන් හී දෙවියන්වහන්සේට මහිම වේවා! පොළොවේ උන්වහන්සේට ප්‍රිය වූ මනුෂ්‍යයන් අතරේ සමාදානය වේවා!"** යි ඔවුහු ගායනා කළහ.

## තෙවන සංසිද්ධි

**සුභාරංචිය!** අවසාන වශයෙන් ගැලවුම්කරුවෙකු මිනිසුන් සහ ස්ත්‍රීන් පාපයෙන් ගලවා ගැනීමට ලෝකයට පැමිණි ආරංචිය නොහොත් සුභාරංචියයි. **"උන්වහන්සේට යේසුස් යන නම තබන්න, මක්නිසාද සෙනඟ ඔවුන්ගේ පාප වලින් ගලවන්නේ උන්වහන්සේය."** ඒ පළමු නත්තලේ ප්‍රධාන කේන්ද්‍රය බවට පත් වූයේ යේසුස්වහන්සේය. තරුව, ප්‍රීති ගීතිකා, දණ නමා නමස්කාර කිරීම, පඬුරු පූජා කිරීම, බලාපොරොත්තුව මේ සියල්ල තිබුණේය. සියල්ල උන්වහන්සේ නිසා උන්වහන්සේ උදෙසාය.

අපි උන්වහන්සේ විශ්වාස කරන්නේ නම් උන්වහන්සේ අපට සමාදානය පොරොන්දු වන සේක. සමාදානයේ කුමාරයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රතික්ෂේප කරන කවරෙකු හෝ ලෝකයට සාමාන්‍ය නැත. අපගේ කෘතිම අදහස් උදහස්, යෝජනා නැමැති කාරණාවන් ලෝකයට ගෙන එන්නේ භිය, කාංසාව, ගැටුම් හා යුද්ධ පමණි.

**"අද දින දාවිත් ගේ නුවර ස්වාමී වූ ක්‍රිස්තුස් නම් ගැලවුම්කරුවෙක් උපන්නේය" (ලූක් 2:11).** බයිබලය එසේ පවසයි. දෙවියන්වහන්සේ හා මනුෂ්‍ය වර්ගය සමඟ විය. බලාපොරොත්තුවක් රහිත අයට බලාපොරොත්තුවක්ද, වරදකරුවන්ට

සමාව ද, හෘද සාක්ෂිය වරදකාරී හැඟීමක් සහිත අයට සමාව හා නිදහස ද, සමාදානය නොදන්නා වූ අයට සමාදානය ද, පව්කරුවන්ට සමාව ද, නරක ආරංචි ඇසූ සියලු දෙනාට සුභාරංචිය ද ලැබීය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියයි!

දෙවියන්වහන්සේ අපට දී ඇති දේ අන් අයත් සමඟ බෙදා ගැනීම නත්තලේ ආත්මයයි. ලෝකයේ ප්‍රධාන අවශ්‍යතාවය වන්නේ ආදරයයි! ලෝකයේ මිනිසුන් සොයන්නේ ආදරයයි! තව කෙනෙකුට ආදරය කරන්න එපා යැයි ලෝකයේ කොහේවත් නීතියක් නැත. "ආදරය" යන වචනය නිශ්ක්‍රීය හෝ මැරුණු වචනයක් නොව, එය ජීවමාන, සක්‍රීය, ක්‍රියාකාරී, බලවත් වචනයකි. "සැබෑ ආදරය නත්තලේ මුර පදයයි"!

පළමු නත්තල් දවසේම සියලු පණිවිඩ හා සියල්ලේදී ගම්‍ය වූ දේ නම් කලින් සැලසුම් කළ යේසුස්වහන්සේගේ මරණයයි. "**උන්වහන්සේ තම සෙනඟ ඔවුන්ගේ පාප වලින් ගලවන සේක.**" එදා ගව මඩුවක ඉපදුණු මේ යේසුස්වහන්සේ ඉන් අවුරුදු 33කට පසු කුරුසියක් මත මරණයට පූජා වූ සේක.

උන්වහන්සේ කුරුසිය මත මිය යන විට, දෙවියන්වහන්සේ ඔබේ සහ මගේ පව් උන්වහන්සේ මත තැබූ සේක. උන්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම නිසා "මම නුඹට සමාව දෙමි" කියා දෙවියන්වහන්සේට පැවසිය හැකිය.

**"උන්වහන්සේගේ නම එම්මානුවෙල් ය." එනම් දෙවියන්වහන්සේ අප සමඟ ය. (යෙසායා 7:14, මතෙව් 1:23).** යේසුස්වහන්සේගේ ජීවිතය, මරණය හා නැවත නැගිටීම තුළින්, දෙවියන්වහන්සේගේ වෙන්වීමෙන් හා ස්වාධීන වීමෙන්, නැවත සමඟිකිරීමේ ප්‍රේමයක් වෙත දෙවියන්වහන්සේ අපට මඟපෙන් වූ සේක.

යේසුස්වහන්සේ අපට ප්‍රේම කරන බවත්, අප සමඟ සිටින බවත් සහතික කර ගනිමු. උන්වහන්සේ අපට සෑම විටම බලාපොරොත්තුව ගෙන දෙයි.! අපගේ පාපයට සමාව දෙයි.! එමෙන්ම අලුත් අත්දැකීමක් නොහොත් අලුත් ගීතිකාවක් අපගේ හදවතේ තබයි.! ඇදහිල්ල ශක්තිමත් කරයි.! හදවතේ තුවාල සුව කරයි.! අපට සහනය ගෙන දෙයි.! අදම මේ දැන්ම ඔබගේ පාපයට සමාව ලැබී ඇති බව සහතික කරගන්න. ඔබ දිනක මරණයට පත් වන බවත්, ඉන්පසු දෙවියන්වහන්සේ මුණගැසීමට ඔබ සූදානම් බවත් සහතික කරගන්න.

අප වෙනුවෙන් යේසුස්වහන්සේ මැරුණු සේක. අප මරණයට පත් වෙනවා. එක්කෝ යේසුස්වහන්සේ නැතිව හෝ ඇතිව ඉන්පසු නිරයට හෝ ස්වර්ගයට අපි යයි. පාරවල් දෙකක් ඇති බව යේසුස්වහන්සේ පැවසූ සේක. පළල් මාවත සහ පටු මාවත. අප තෝරාගන්නේ කුමක්ද? තෝරා ගැනීමට ස්වාමීවරුන් දෙදෙනෙකු සිටින බවත් උන්වහන්සේ පැවසූ සේක. තමා හෝ ක්‍රිස්තුස්වහන්සේ යන ස්වාමිවරු දෙදෙනාගෙන් තෝරාගැනීම ඔබ සතුය. දෙවියන්වහන්සේගේ පුදුමාකාර තෝරා ගැනීමේ හැකියාව ඔබට ද මට ද දී ඇත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තෝරා ගැනීමට දෙවියන්වහන්සේ ඔබට උපකාර කරන සේක්වා.!

**- ජීවන හඬ -**

# දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් සමඟ

"එයා නම් මනුෂ්‍ය රූපයක් ගත් දෙවියෙක්". මෙය ජනවහරයේ එන කියමනක්. එසේ කීමට හේතු සාධක වියහැක්කේ ඔවුන්ගේ යහපත්කම, ගුණවත්කම, මිනිසුන්ට දක්වන කරුණාව, නිහතමානීකම හා තවත් එවැනි ගුණාංග විය හැකිය. එවන් අයට පෙරලා මිනිසුන්ගේද ගෞරවයද ලැබෙනු බව ඔබ දැක ඇත. කලින් කලට මෙවැනි යහ ගුණයෙන් හෙබි මනුෂ්‍යයන් බිහිවුනත්, ඔවුන්ගේ මරණයෙන් පසු එම යහපත තාවකාලික බව පෙනේ. එහෙත් සදාකාලයටම මනුෂ්‍යයන් සමග වාසය කරන්ට, ඔවුන් අනුකම්පා කරමින් කරුණාව හා දයාව දක්වන්නට කැමති වූ සැබෑ දෙවියන්වහන්සේ ගැන ඔබ දන්නවාද? ඒ දෙවියන්වහන්සේ සැබෑ ලෙසම මනුෂ්‍යයන් සමඟ ජීවත්වන්නට මෙලොවට පැමිණි බව ඔබ විශ්වාස කරනවාද? මනුරුව ගත් ස්වර්ගයෙන් බැස ආවා වූ මේ දෙවියන්වහන්සේ නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේයි. මේ තැනැන්වහන්සේ ගැන කරුණු ලියන්නට ප්‍රථමයෙන්, සදාකාලයටම වැඩසිටින එකම සැබෑ දෙවියන්වහන්සේ ගැන යමක් සඳහන් කරන්නට කැමැත්තෙමි.

දෙවියන්වහන්සේ ගැන දැනගැනීම එතරම් පහසු නැත. උන්වහන්සේගේ



අපිරිමිත බලය, ශක්තිය, ප්‍රඥාව හා මහිමය අප අවට ඇති ස්වභාව ධර්මය හොඳහැටි ප්‍රකාශ කරයි. උදාහරණයක් වශයෙන් ශුද්ධ බයිබලයේ **ගීතාවලිය 19:1** හි මෙසේ සඳහන් වේ. **"අහස දෙවියන්වහන්සේගේ මහිමය ප්‍රකාශ කරයි., ගුවන්තලය උන්වහන්සේගේ හස්තකර්මාන්තය දක්වයි".** ස්වභාව ධර්මය ලෙස අප හඳුන්වන අප අවට ඇති ලෝකය හා විශ්වය ඉබේ ඇති වූවක් ලෙස උපකල්පනය කළ හැකි නොවේ. අපගේ විශ්වය ඉතා සංකීර්ණවූත් එහෙත් ඉතාම ක්‍රමවත්වූත් එකක් බව අපි දනිමු. විශාලත්වය, විවිධත්වය හා ක්‍රමානුකූලභාවය එදා මෙදා තුර ශ්‍රේෂ්ඨ විද්‍යාඥයින් සහ ගවේෂකයින් විසින් පෙන්වා දී ඇත. විශ්වය තුළ පවතින ගුරුත්වාකර්ශන බලය, තාප ශක්තිය, ධ්වනි ශක්තිය, විභව ශක්තිය වැනි සියලු ශක්ති ප්‍රභේදයන් හඳුනාගනිමින් සහ උපයෝගී කරගනිමින් මිනිසා ඉතා ප්‍රයෝජනවත් මෙවලම් නිපදවා ඇත.

එවැනි මෙවලම් මිනිසා නිපදවූ බව අප විසින් පිළිගන්නා අතරම මෙවැනි ක්‍රමවත් විශ්වයක් නිර්මාතෘවරයෙකු නැතුව බිහිවූයේ යැයි විශ්වාස කිරීම අනුවණ ක්‍රියාවකි. ශුද්ධ බයිබලයේ අපට හෙළිදරව් කර දෙන්නේ සර්ව බලය තමන් සතුවූ ස්වාධිපත්‍යයෙන් යුතු සැබෑ වූ දෙවියන්වහන්සේය. උන්වහන්සේගේ අද්විතීයවූ මහිමය හා දිව්‍යමය ස්වභාවය ගැන අප දැන ගන්නේ ශුද්ධ බයිබලයෙනි. උන්වහන්සේ විසින්ම කර ඇති එළිදරව් කිරීම් කියවීම කරණකොටගෙනය.

අතීතයේ, වර්තමානයේ සහ අනාගතයේ මේ විශ්වයේ හැමදෙයක්ම දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍යය යටතේ සිදුවන ඒවාය. මෙලොව සිදුවූ බොහෝ ඓතිහාසික සිදුවීම් ඒවා සිදුවන්නට පෙර අනාගතවාක්‍ය ලෙස ශුද්ධ බයිබලයෙහි ලියැවී තිබුණි. ඉන් ඇති වැදගත් වන ඓතිහාසික සිදුවීම නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙලොව උපත ලැබීමයි. මේ සමයේ මිනිසුන් විසින් සමරනු ලබන යේසුස්වහන්සේගේ උපත පිළිබඳව, එම උපත පිළිබඳව වසර 800කට පෙර යෙසායා අනාගතවක්තෘ තුමා විසින් මෙසේ ප්‍රකාශ කර තිබුණි. **"එබැවින් ස්වාමීන්වහන්සේම ඔබලාට ලකුණක් දෙන සේක; බලව, කන්‍යාව ගර්භණීව පුත්‍රයෙකු වදා, එම්මානුවෙල් යන නම ඔහුට තබන්නීය" (යෙසායා 7:14).** උන්වහන්සේගේ උත්පත්තියෙන් පසුව මේ ඉහත කී අනාගතවාක්‍ය ඉටුවුණු බව **මතෙව් 1:22,23** පදවල සඳහන් කොට ඇත. **"මේ සියල්ල සිදුවූයේ, බලව කන්‍යාව ගර්භණීව පුත්‍රයෙකු වදන්නීය; උන්වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනවා ඇත. කියා ස්වාමීන්වහන්සේ අනාගතවක්තෘ ලවා කියෙවූ කීම සම්පූර්ණ වන පිණිසය. ඒ නාමයේ අර්ථය නම් දෙවියන්වහන්සේ අප සමඟය යනුයි"**. උන්වහන්සේගේ නාමය එම්මානුවෙල් ලෙස එහි සඳහන් වේ. එහි අරුත නම් "දෙවියන්වහන්සේ අප සමඟය" යනුයි. එනම් දෙවියන්වහන්සේ මිනිස් සිරුරකින් යුතුව කන්‍යා මවක් තුළින් ඉපද, මිනිසුන් අතර මිනිසකු මෙන් මෙලොවට පැමිණි බවයි. සදාකාලික වූත් සීමා රහිත වූත් ප්‍රඥාවෙන් අනුවනවූත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මිනිසත් බව ගැනීම තුළින්, අප කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය කෙතරම් විශාලදැයි සිහිපත් කරදෙයි. මෙය අදහාගත නොහැකි තරම් විශ්මය ජනක කර්තව්‍යයකි. එහෙත් අප එය ඇදහිය යුතුය. ගව මඩුවක ඉපදී, ගවමඩුවක හැදී වැඩී, පව් රහිත අති ශුද්ධ මිනිසෙකු ලෙස උන්වහන්සේ මනුෂ්‍යයන් අතර ජීවත් වූ සේක. තවද උන්වහන්සේගේ බලය සහ දේවත්වය, සුළං කුණාටු සහ මුහුද නිශ්චල කිරීමෙන්ද, ලෙඩ රෝග පහකරමින් දිව්‍ය සුවය ඉපදීමෙන්ද, මළවුන් පවා නැගිටුවීමෙන්ද සනාථ කළ සේක. මේ අපූරු කතාව දැන ගැනීමට ශුද්ධ බයිබලයේ අලුත්ගිවිසුම් කොටසේ

මතෙව්, මාක්, ලූක්, යොහාන් නමින් හැඳින්වෙන පොත්වල සඳහන් දේවවචන කොටස් කියවා බලන මෙන් ඔබට ඇරයුම් කරමි. අදෘශ්‍යමාන දෙවියන්වහන්සේගේ ස්වභාවය මෙලොවට ප්‍රකාශ කළේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින්ය. "**කිසිවෙක් කිසිකලක දෙවියන්වහන්සේ දුටුවේ නැත; පියාණන්වහන්සේගේ ළයේ ඉන්නාවූ ඒකජාතක පුත්‍රයාණන්වහන්සේව උන්වහන්සේ ප්‍රකාශ කළසේක" (යොහාන් 1:18).**

මේ සත්‍ය කරුණු මෙසේ වන අතර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළවට පැමිණීමේ ප්‍රධාන අරමුණ වූයේ පව්කාර මිනිසා නිරයේ දඬුවමින් ගලවාගැනීමය. "**පව්කාරයන් ගළවන්ට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ලෝකයට ආසේක යන කීම විශ්වාසවූ සර්ව ප්‍රකාරයෙන් පිළිගත යුතුවූ කීමක්ය" (1 තිමෝති 1:15).** නිරයෙන් ගැළවෙනවා පමණක් නොව දෙවියන්වහන්සේ සමඟ සදාතනික සම්බන්ධතාවයකට එළඹෙන්නටත්, යේසුස්වහන්සේ කල්වාරි කුරුසිය මත කළ ජීවිත පූජාව හේතුසාධක වේ. දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවයකට පිවිසිය හැකි එකම මඟ යේසුස් ක්‍රිස්තුවහන්සේය. **"යේසුස්වහන්සේ කියනසේකː මාර්ග යද, සැබෑවද ජීවනයද මමයි. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත" (යොහාන් 14:9).**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ තවත් අද්විතීය සත්‍යයක් නම් උන්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමයි. එබැවින් යේසුස්වහන්සේ අද ජීවමානව සිටින තැනැන්වහන්සේය. යේසුස්වහන්සේ ඊයෙත්, අදත් සදාකාලයටත් ඒකාකාරමය යැයි **හෙබ්‍රෙව් 13:8** හි සඳහන්ව ඇත. මළවුන්ගෙන් යළි නැගිටි උන්වහන්සේ දැන් දෙවියන්වහන්සේගේ සිංහාසනයේ දකුණු පාර්ශවයේ වැඩසිටින බව **මාර්ක් 16:19** සඳහන් වේ. මීට වසර 2000කට පෙර මනුෂ්‍යයන් සමඟ වාසය කරන්නට පැමිණි තැනැන්වහන්සේ වර්තමානයෙහි දෙවියන්වහන්සේ සමඟ සිටින මනුෂ්‍යයා ලෙසට අප උදෙසා මැදහත්කම් කරන සේක. "**මැරුණෙත්, ඒ ඇර මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවෙත්, දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කාම් කරන්නෙත් ක්‍රිස්තුස්වහන්සේය" (රෝම 8:34).** පව්කමාව, දේව දරුකම, සදාකාල ජීවනය, නොබිඳෙන සාමය, නිම නොවන ප්‍රීතිය, සහ ඒ සියල්ල අවසානයේ ස්වර්ගීක උරුමය ලබාදෙන්නට හැකි ස්වාමීවූ යේසුස්වහන්සේ අදහා පිළිගැනීම තරම් ප්‍රඥාගෝචර වූ තීරණයක් තවත් නැත.

**- ඈන් ජයසුන්දර -**




# දේදුනු වර්ණ සංගමය පිළිබඳ බයිබලීය දැනුම

ලෝකයේ බොහෝ ක්ෂේත්‍රයන් විපර්යාස වලට ලක්වෙමින් පවතින අතර, නව තාක්ෂණය පමණක් නොව අලුත් අදහස්, නව නීති රීති, නව චින්තනයන් මිනිස් සිත් තුළ හට ගනිමින් පවතී. සමහර සිතිවිලි හා චින්තනයන් විරූපී ඒවා ද වේ. මෙවැනි තත්ත්වයන් ඈත අතීත ලෝකයේ නොතිබුනා යැයි කිව නොහැකිය. නමුත් මේවා කරළියට ආවේ ඉතා අල්ප වශයෙනි. වර්තමාන තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස් ය. සමානාත්මතාවය වෙනුවෙන් මහා ප්‍රමාණයේ හඬ නගන වර්තමානයේ සම අයිතිවාසිකම් ඉල්ලන තවත් එක් විශේෂ ප්‍රජාවක් නිරන්තරයෙන් අප දෘෂ්ඨිකෝණයට හසුවෙමින් පවතී. විශේෂයෙන් සමාජ මාධ්‍යය හරහා තමන් පිළිබඳ ව සමාජයට කතා කිරීමට උත්සහ දරන බැවින් සමාජ මාධ්‍යය භාවිතයේදී ඔවුන් ගැන නිරන්තරයෙන් අපට අසන්නට දකින්නට ලැබේ.

මෙම කණ්ඩායම තමන් හැඳින්වීමට පාට 6කින් යුක්ත ධජයක් භාවිතා කරයි. මෙම දේදුණු වර්ණ සහිත ධජය යටතේ " අභිමන් පා ගමන් " ලෙස නිදහස් පා ගමන් පවත්වයි. මෙම කණ්ඩායම හඳුන්වන්නේ සමරිසි හා ලිංගික සංක්‍රාන්තිකයන් සහිත ප්‍රජාවක් ලෙසය. තමන් සිතෙන් ආශා වෙන ලිංගි ක අනන්‍යතාවය ඇතිව ජීවත් වීම සඳහා වෛද්‍ය විද්‍යාවේ දියුණුව ප්‍රයෝජනයට ගනිමින් තම ශරීරය අඩුවෙන් හෝ වැඩියෙන් වර්ධනය කර ගනිමින් හෝ අවයව වෙනස් කර ගැනීමට පෙළඹී සිටී. පෙර නොවූ විරූ පරිදි බොහෝ ලෙස මෙම ප්‍රජාව විවිධ අංශ වලින් සමාජ ගත වෙමින් පවතී.

ශුද්ධ බයිබලයේ පුරාම විවිධ අවස්ථාවල මෙවැනි විවිධ පුද්ගලයන් හා මෙවැනි තත්වයන් ගැන විස්තර සඳහන්ව තිබෙන අතර, ඒ අය උදෙසා දෙවියන්වහන්සේගේ ක්‍රියා කිරීමද සඳහන්ව තිබෙනවා. බයිබලීය ඉතිහාසයේ සොදොම සහ ගොමෝරාවේ විනාශය දැක්විය හැක. සොදොම සහ ගොමෝරාව එක් රැයකින් මෙවැනි පිළිකුල් සහගත තත්වයට පත් වූවා නොව, කාලයත් සමඟ මේ අදහස් පැතිරීමෙන් එය තම විනාශය ළඟාකර ගත්තේය.

දෙවියන්වහන්සේ පුරුෂයෙක් ද ස්ත්‍රීයෙක්ද වශයෙන් ඔවුන් මැවූ බව **මතෙව් 19:4** හි සඳහන්ව තිබේ. මෙම ව්‍යවහාරයෙන් බැහැරව කිසියම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් තමන් සමරිසි යැයි සිතන්නෙහි නම් එය රෝගී තත්වයකි. වර්තමාන ලෝකයේ සෝචනීය තත්වය නම් මෙම තත්වය ප්‍රතික්ෂේප නොකර, එය දියයුතු තත්වයක්, අයිතිවාසිකමක් ලෙස සැලකීමයි. මෙය නිදහස් මතයක් ලෙස සිතුවත් එය ඉතාම වැරදි තත්වයකි. එලෙසම **1 කොරින්ති 6:9-10** හී සඳහන් වන ආකාරයට මෙවැනි අනාචාරකම් කරන්නන් ගණන් ගනු ලබන්නේ දෙවියන්වහන්සේගේ රාජ්‍ය උරුමකර නොග න්නන් ලෙසය. තව දුරටත් මෙම තත්වය ගැන බයිබලීය විග්‍රහයන් සළකා බලමු.

**රෝම 1:26 - 27 "ඒ නිසා දෙවියන්වහන්සේ ඔවුන් නීච තෘෂ්ණාවලට භාරදුන්සේක. ඔවුන්ගේ**

**ස්ත්‍රීහු ස්වභාවික ව්‍යවහාරය ස්වභාවයට විරුද්ධ වූ ව්‍යවහාරයට වෙනස් කළෝය. එසේම පුරුෂයෝද ස්ත්‍රිය සම්බන්ධ ස්වභාවික ව්‍යවහාරය අත් හැර ඔවුන් කෙරෙහි රාගයෙන් මත්ව පුරුෂයෝ පුරුෂයන් සමඟ අශෝභනදේ කරමින් තමුන්ගේ වරඳ වලට සුදුසු එල තමුන් තුලම ලැබුවෝය".**

**ලෙවි කථාව 10:22 - ගැහැණුන් සමඟ මෙන් පිරිමින් සමඟ සංවාසය නොකරන්න. ඒක පිළිකුලක්ය.**

**ලෙවී කථාව 20:13 - මනුෂ්‍යයෙක් ගැහැණියකු සමඟ සයනය කරන්නාක් මෙන් පිරිමියකු සමඟ සයනය කළොත් ඔවුන් දෙදෙනාම පිළිකුලක් කළෝය. ඔවුහු සැබවින්ම මැරිය යුතුය. ඔවුන්ගේ ලේ ඔවුන් පිට වන්නේය.**

පෙර සඳහන් කළ පරිදි සොදොම සහ ගොමෝරාවේ පිළිකුළ දෙවියන්වහන්සේ උන්වහන්සේ ඉදිරියෙන් විනාශ කළ සේක. එම කථාව **උත්පත්ති 19:1-28** දක්වා පදවල සඳහන්ව තිබේ. එලෙසම නෝවාගේ කාලයේ සිදුවූ ජලගැල්මෙන් ලෝකයේ විනාශය සිදුවූයේද මෙම පාපය නිසාය. LGBTQIA++ ලෙසින් අප වර්ථමානයේදී හඳුන්වන ප්‍රජාව තමන්ට ආවේනික ධජයකින් හා නීතිගත කරගන්නට තැත්කරන නීති රීති මාලාවකින් උත්සහ කරන්නේ තමන්ටම ආවේනික සමාජයක් හෝ සංස්කෘතියක් ගොඩනගා ගැනීමයි. සංක්‍රාන්ති ලිංගිකයන් ලෙස තම උපන් ලිංගිකත්වය වෙනස් කර ගනිමින් ස්වභාවික ව්‍යවහාරයට පටහැනිව ක්‍රියාකිරීමට මොවුන් උත්සාහ කරයි.

තවදුරටත් ශුද්ධ බයිබලයෙහි නපුංසකයින් ලෙස හඳුන්වන කොටසක්ද සිටී. නමුත් මෙම කොට්ඨාශය ඉහත සඳහන් කණ්ඩායමෙන් නිදහස්ය. ඇදහිලිවන්තයන් වන අප මොවුන් පිළිබඳ අනුකම්පාකර, පාපයේ බැරෑරුම්කම තේරුම්කර දිය යුතුය. එමෙන්ම සුභාරංචිය පවසා යේසුස්වහන්සේ කෙරෙහි ඇදහීමට ඔවුන් පෙළඹිය යුතුය. දේව වචනය වඩා කියවීමෙන් හා මෙනෙහි කිරීමෙන් උන්වහන්සේගේ හදවත සොයා දැනගමු. දේව වචනය තුළ වර්ධනය වෙමු.

ඔබ පුවත්පත් හෝ වෙනත් මාධ්‍යයන් හරහා දැන් නිරන්තරයෙන් අසන්නට හා දකින්නට ලැබෙන මේ LGBTQ++ යන අකුරු වලින් හැඳින්වෙන්නේ කුමක්දැයි බලමු.

**L** - Lesbian හෙවත් සමලිංගික කාන්තාවන් (සමරිසි ස්ත්‍රීන්)

**G** - Gay සමරිසි පුරුෂයින්

**B** - Bysexual හෙවත් ද්විලිංගික ඇසුර පවත්වන අය

**T** - Transgender සංක්‍රාන්ති ලිංගිකයන් - එක් ලිංගිකත්වයක සිට තවත් ලිංගිකත්වයකට මාරු වූ අය

**I** - Intersexual - පුරුෂ සහ ස්ත්‍රී යන ලිංගේන්ද්‍රයන් දෙකම සහිතව උපන් අය

මේ අය තමන් ගැහැණුන්ද පිරිමින්ද යන්න වග තමන්ම තෝරා ගත යුතු තත්වයකි.

**A** - ලිංගික හැඟීම් හෝ ආශාවන් නොමැති ගැහැණුන් හෝ පිරිමිය. මොවුන්ට ලිංගික දිශානතියක් නොමැත.

**නෙවිල් ජයසුන්දර**
**සහෝදරයාගේ දේශනාවක් ඇසුරෙන්**
**සකස්කලේ - ශෂිලා ද සිල්වා**

2025 නව වසර ඔබ සැමට දෙවියන්වහන්සේගේ
ආශිර්වාදය, කරුණාව, අනුග්‍රහය බහුල

# නව වසරක් වේවා !

## නව වසරේ අභියෝග

- ⋆ දිනපතා බයිබලය පිළිවෙලින් කියවමු.
- ⋆ වඩ වඩා දෙවියන්වහන්සේට කථා කරමු.
- ⋆ සෑම ඉරු දිනකම සභාවට යමු.
- ⋆ සතුටු සිතින් දෙවියන්වහන්සේට පූජා කරමු.
- ⋆ එකිනෙකා ඇදහිල්ලෙන් ශක්තිමත් කරමු.
- ⋆ අපට වරද කරන අයට නිතර සමාව දෙමු.
- ⋆ අපේ දරුවන්ට දෙවියන්වහන්සේ පිළිබඳ කියා දෙමු.
- ⋆ එකිනෙකාට හැකි පමණින් උපකාර කරමු.

www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)

CFC Colombo


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com